# ආඩම්බර රෝස මල



රනුකි දිහන්සනා

# ආඩම්බර රෝස මල

## රනුකි දිහන්සනා

කතෘ

කතෘගේ වෙනත් කතා

පූස් පැටියා සහ බලු පැංචා - 2025

කතාව සහ පින්තූර

## රනුකි දිහන්සනා

මහ/ මහාමායා බාලිකා විදූහල

2-D

2025.02.08

ISBN : 978-624-208-479-4

# පිදුම

මා ආදරයෙන් හැදූ වැඩූ

දෙමාපියන්ටත්,

අකුරු කියා දුන්

ගුරු මැණිවරුන්ටත්,

මෙම පොත

පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න, එකෝමත් එක කාලෙක ලස්සන ගෙවත්තක් තිබුණා. ඒ ගෙවත්තේ ලස්සන මල් දෙකක් පිපී තිබුණා. එකක් ලස්සන රෝස මලක්. අනෙක් මල සූරියකාන්ත මලක්.






රෝස මල හරි ම අකාරුණිකයි. ඒත් සූරියකාන්ත මල නම් හරි ම කරුණාවන්තයි. සමනලුන්ට, කුරුල්ලන්ට, මී මැස්සන්ට, එයාගේ මල් පැණි බොන්නට ඉඩ දුන්නා. හැබැයි රෝස මල නම් ඒකට ඉඩ දුන්නේ නැහැ. ඒ මොකද..... එයාගේ ලස්සන මල් පෙතිවල කුණු ගෑවෙන නිසා.



ඔහොම ටික කාලයක් ගත වුණා. සමනලුන්ට, කුරුල්ලන්ට හරිම දුකයි.සුරංගනාවියක් මේ දිහා බලාගෙන හිටියා.

සුරංගනාවි හිතුවා රෝස මලට හොඳ පාඩමක් උගන්වන්න ඔනි කියලා. රෝස මලේ මල් පෙති ඉක්මනින් ම අවලස්සන වෙලා පරවෙලා ගැලවිලා යන්න කියලා හිතුවා.එය ඒ විදියටම ඉෂ්ට වුණා .





සූරියකාන්ත මල සමනලුන්ට , මී මැස්සන්ට , කුරුල්ලන්ට මල් පැණි බොන්නට ඉඩ දුන් නිසා මුළු ගෙවත්තේ ම සූරියකාන්ත මල් යායක් පැතිරුණා .



ඔන්න ඉතින් රෝස මලටත් හරිම දුකයි.මම කළේ ලොකු වැරැද්දක් කියලා රෝස මලට තේරුම් ගියා.මී මැස්සන්ට , සමනලයින්ට ,කුරුල්ලන්ට මල් පැණි බොන්නට ඉඩ දුන්නා .



එදා පටන් රෝස මලත් සූරියකාන්ත මලත් සූරියකාන්ත මලත් සතුන්ට මල් පැණි ලබා දෙමින් සතුටින් ජීවත් වුණා .

## නිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාත්‍ය සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්